# බස්නාහිර පළාතේ පළාත් සභා රැස්වීම

## 2016 ජූනි මස 20 වන අඟහරුවාදා

**බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 204 හි පිහිටි බස්නාහිර පළාත් සභා ගොඩනැගිලි සංකීර්ණයේ සභා ශාලාවේදී පවත්වන ලද රැස්වීම**

පූ.භා. 09.32 ට සභාව රැස් විය. ගරු සභාපතිතුමා මූලාසනාරූඪ විය.

**●පැමිණීම :**

| | |
|---|---|
| ගරු සුනිල් විජේරත්න | (සභාපතිතුමා) |
| ගරු යසපාල කෝරලගේ | (නියෝජ්‍ය සභාපතිතුමා) |
| ගරු ඉසුර දේවප්‍රිය | (බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රමසම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමා) |
| ගරු ගාමිණී තිලකසිරි | (බස්නාහිර පළාතේ කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, ධීවර, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන අමාත්‍යතුමා) |
| ගරු රංජිත් සෝමවංශ | (බස්නාහිර පළාතේ අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමා) |
| ගරු ලලිත් වනිගරත්න | (බස්නාහිර පළාතේ මාර්ග, ප්‍රවාහන, සමුපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදි කිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන අමාත්‍යතුමා) |
| ගරු සුමිත් ලාල් මැන්දිස් | (බස්නාහිර පළාතේ සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමා) |
| ගරු සුනිල් ජයමිණී | (සභා නායකතුමා) |
| ගරු ලාලන් සුදත් මංජු ශ්‍රී අරංගල | (විපක්ෂ නායකතුමා) |
| ගරු ගුණසිරි ජයනාත් | (ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා) |
| ගරු යූ. ජෝර්ජ් පෙරේරා | (විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා) |

**ගරු මන්ත්‍රීවරු**

අනන්ද හරිස්චන්ද්‍ර ද සිල්වා
අනුරුද්ධ ලේකම්ගේ
අසෝක රන්වල
අශෝක දයාරත්න
අර්ෂාඩ් නිසාම්ඩීන්
ඇ. ශ්‍රීනාත් ම. පෙරේරා
ඉෆ්තිකාර් ජෙමීල් මරික්කාර්
ඊ.ඒ. නන්දන පත්මකුමාර
උදාර රත්නායක
උදේන විජේරත්න
උපාලි කොඩිකාර
උපාලි ගුණරත්න
උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ
එම්.එස්.එම්. රහීම්
එස්. කුහවරදන්
එස්.එම්. සකාවුල්ලා
ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව
කාමල් කුරුප්පු
කිත්සිරි කහටපිටිය
කීර්ති කාරියවසම්
කුරුසාමි කලන්කාඩ් තේවර්
කේ.ඩී. අරුණ දීපාල්
කොලන්නගේ වජිර පෙරේරා
ගමගේ නිහාල් ප්‍රේමශාන්ත පෙරේරා
ජගත් අංගගේ
ජගත් කුමාර
ජගත් පී. විතාන
ජයන්ත ද සිල්වා
ඩී.ඩබ්ලිව්. පුෂ්පකුමාර ද සිල්වා
තුවාන් ආමිත් මොහමඩ් අක්රම්
තෙබුවන පියනන්ද හිමි
නිමල් ආර්. පීරිස්
නිමල් චන්ද්‍රරත්න
නිරෝෂ් ඩිල්ෂාන් ජයවර්ධන
නිරෝෂන් පාදුක්ක
නිරෝෂා අතුකෝරල මැතිනිය
නිශාන්ත ශ්‍රී වර්ණසිංහ
නීල් සුනේත්‍රලාල් ප්‍රනාන්දු
පී.ආර්.පී. අබේගුණවර්ධන
පී.ඩී. අබේරත්න
ප්‍රදීප් උඳුගොඩ
ප්‍රදීප් පෙරේරා
බී.පී. ලක්ෂ්මන් ගුණවර්ධන
මහින්ද ජයසිංහ
මහේෂ් අල්මේදා
මංජුල ප්‍රසන්න සම්පත්
මංජුල බුද්ධදාස
මෙරිල් පෙරේරා
මොරිස් විජේරත්න
මොහොමඩ් ෆයිරුස්
මොහොමඩ් ෆායිස්
යූ.එල්.එන්.පී. උඩවෙල
රන්දීර් රොද්‍රිගෝ
රවීන්ද්‍ර යසස් කුමානායක
රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්
රොයිස් විජිත
රෝස් ප්‍රනාන්දු මෙනෙවිය
ලක්ෂ්මන් නිපුණ ආරච්චි
ලලන්ත ගුණසේකර
ලලිත් එල්ලාවල
ලලිත් වර්ණකුමාර
ලෙනාඩ් කරුණාරත්න
සරත් පතිරණ
සලෝචන ගමගේ
සහන් ප්‍රදීප්
සිරිකමල් පිලීෂියන් ද සිල්වා
සුනිල් වටගල
සුමිත් විජයමුණි ද සොයිසා
සුසාර දිනාල්
සුසිල් කිඳෙල්පිටිය
සේනක දමයන්ත ද සිල්වා
ශ්‍රීනාත් පෙරේරා
හරිස්චන්ද්‍ර කොස්තා
හෙක්ටර් බෙත්මගේ

**නොපැමිණීම :**

**ගරු මන්ත්‍රීවරු**

අනුරාධ විමලරත්න
අමල් සිල්වා
ඇන්ටනී උපුල් රාජිත
ඉන්දික බණ්ඩාර
එස්.ඒ. සමන්මලී සකලසූරිය මැතිනිය
කෝකිලා හර්ෂනී ගුණවර්ධන මැතිනිය
චන්දන ජයකොඩි
ජනක දීපාල් වැලිවත්ත
ඩෝල්ටන් ජානක සූරියබණ්ඩාර
නව්සර් ෆව්සි
මල්ෂා කුමාරණතුංග මැතිනිය
රජිත හපුආරච්චිගේ
රවී විජේසේකර
රොජර් සෙනෙවිරත්න
ලයනල් ජයසිංහ
විජිත් ප්‍රියන්ත
සන්ධ්‍යා සිරිවර්ධන මැතිනිය
සෙනල් වෙල්ගම
ශිරන්ත අමරසේකර

***පූ.භා. 09.33 ට සභාවේ ගණපූරණය නොමැති බව අරුණ දීපාල් ගරු මන්ත්‍රීතුමා විසින් පෙන්වා දෙන ලදින්, ගරු සභාපතිතුමා විසින් කැඳවීම් සීනුව නාද කරවීමට නියෝග කරන ලදී.***

***පසුවද, ගණපූරණය ඇති විය.***

## 01. සභාපතිවරයාගේ නිවේදනය :

*i*

*"ප්‍රධාන ලේකම් කාර්යාලයීය සැලසුම් අංශය විසින් වාර්ෂිකව සකස් කරනු ලබන සංඛ්‍යා ලේඛන ඇතුළත් අත්පොත (Statistical Hand Book – 2016) ගරු මැති ඇමැතිතුමන්ලා වෙත ලබා දීම සඳහා එවා ඇති බවත්, එම අත්පොතේ පිටපත් ගරු මන්ත්‍රීවරුන්ගේ මේසය මත තබා ඇති බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී."*

## 02. කාරක සභා වාර්තා :

2017.06.07 වන දින පැවැති සභා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම් වාර්තාව ගරු සභාපතිතුමා විසින් පිළිගන්වන ලදී.

***පූ.භා. 10.31 ට ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු නියෝජ්‍ය සභාපතිතුමා [යසපාල කෝරලගේ මහතා] මූලාසනාරූඪ විය.***

## 03. පළාත් සභාවේ කටයුතු :

ගාමිණී තිලකසිරි ගරු අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද පහත සඳහන් යෝජනාව සභා සම්මත විය.

*"2017.06.07 වන දින පැවැති සභා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීමේදී එළඹුණු එකඟතාවයට අනුව අද දින න්‍යාය පත්‍රයේ අංක X පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ කටයුතු විෂයය යටතේ සඳහන් වැඩ කටයුතුවල ප්‍රමුඛතා අනුපිළිවෙළ අංක 04, 01, 02, 03 ලෙස විය යුතු යැයි සලකා ක්‍රියා කළ යුතුය."*

## 04. පෞද්ගලික මන්ත්‍රී යෝජනාව : (රීති අංක 107 යටතේ 2017.06.06 දින ඉදිරිපත් වූ යෝජනාව)

*2017.06.06 වන දින පළාත් සභා රැස්වීමේදී කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ස්ථිර කරමින් ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමා විසින් සංශෝධනයක් ඉදිරිපත් කරන ලදී. පසුව ගණපූරණය නොමැතිකමින් කල් ගිය එකී යෝජනාව යළිත් අද දින සභාභිමුඛ කරන ලදී.*

*යෝජනාව : [ගරු කිත්සිරි කහටපිටිය විසිනි]*

*"බස්නාහිර පළාතේ සහ අනෙකුත් පළාත්වල පසුගිය දිනවල ඇද හැළුණු වර්ෂාපතනය නිසා ඇති වූ ගංවතුරෙන් සහ නායයෑම් වලින් මියගිය හා අවතැන් වූ ජනතාවට බස්නාහිර පළාත් සභාව තම කනගාටුව පළ කර සිටින්නීය."*

*සංශෝධිත යෝජනාව : [ගරු ලලිත් එල්ලාවල විසිනි]*

*"පසුගිය දින කීපය තුළ ඇති වූ නායයෑම හා ජල ගැලීම් තුළින් බස්නාහිර පළාත තුළ පමණක් පවුල් 55,962 ක්ද, පුද්ගලයන් වශයෙන් ගත් කළ 212,971 ක් ආපදාවට ලක් වූ අතර අතුරුදහන් 50 ක් හා මියගිය 65 ක් වන අතර අතුරුදහන් හා මියගිය අය වෙනුවෙන් සාධාරණ වන්දි මුදලක්ද සම්පූර්ණයෙන් ජලයෙන් යට වූ නිවාස සඳහා මූලික අවශ්‍යතාවයන් ඉටු කර ගැනීමට රුපියල් 50,000/- ක මුදලක් ද කඩිනමින් පළාත් සභාවෙන් ලබා දෙන ලෙස පළාත් සභාව යෝජනා කර සිටින්නීය."*

***සංශෝධිත ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

## 05. රීති අංක 107 යටතේ යෝජනාව :

අරුණ දීපාල් ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලදුව, ප්‍රසන්න සංජීව ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කරන ලද පහත සඳහන් යෝජනාව සභා සම්මත විය.

*"පොදු වැදගත්කමකින් යුක්ත වූ පහත සඳහන් වන යෝජනාව සභාවට ඉදිරිපත් කිරීම පිණිස කාර්ය පටිපාටි රීති අංක 107 යටතේ සලසා ඇති ප්‍රතිපාදනවලට අනුකූලව හා ඊට ආනුෂංගිකව කාර්ය පටිපාටි රීති 8(5), 8(6), 15(2), 15(5), 53(2), 53(3), 57(2) හා 57(5) යන රීතීන් අත්හිටුවිය යුතු යැයි යෝජනා කරමි."*

## 06. පෞද්ගලික මන්ත්‍රී යෝජනාව :

අරුණ දීපාල් ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද පහත සඳහන් යෝජනාව ජෝර්ජ් පෙරේරා විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා විසින් ස්ථිර කරන ලදී.

*"බස්නාහිර පළාත් සභා බල ප්‍රදේශයේ මහජනතාවට සේවා සැපයීම සඳහා සහ පළාත් සභාවේ පරිපාලනය මෙහෙයවීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනය මගින් සලසා ඇති ප්‍රතිපාදන ප්‍රකාරව එහි නවවන උපලේඛනයේ 1 වන ලැයිස්තුවේ (පළාත් සභා ලැයිස්තුව) 36 : 16 ට අනුව එනම් ආදායම් තක්සේරුව සහ එකතු කිරීම ඇතුළු ඉඩම් ආදායම් සහ ආදායම් කාර්ය සඳහා ඉඩම් වාර්තා සමීක්ෂණය සහ පවත්වාගෙන යාම විෂය යටතේ පළාත් තක්සේරු දෙපාර්තමේන්තුවක් / අධිකාරියක් කඩිනමින් ස්ථාපිත කළ යුතු බව මෙම පළාත් සභාව අදහස් කරයි."*

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***

***ශ්‍රීනාත් පෙරේරා ගරු මන්ත්‍රීතුමා විසින් නඟන ලද රීති ප්‍රශ්නයට අනුව රීති අංක 107 යටතේ වූ පෞද්ගලික මන්ත්‍රී යෝජනාව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට එකඟද යන්න විමසා බැලීම සඳහා පූ.භා. 11.40 ට පළාත් සභාව තාවකාලිකව අත්හිටුවන ලදින්, පූ.භා. 11.51 ට යළිත් රැස් වූ අතර, එකී යෝජනාවේ වැඩ කටයුතු ආරම්භ කරන ලදී.***

***අ.භා. 12.03 ට ගරු නියෝජ්‍ය සභාපතිතුමා [යසපාල කෝරලගේ මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, හෙක්ටර් බෙත්මගේ ගරු මන්ත්‍රීතුමා මූලාසනාරූඪ විය.***

***පසුව ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

## 07. කල් තැබීම :

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා විසින් පළාත් සභාව කල් තබන ලදී.

***ඊට අනුකූලව, පළාත් සභාව අ.භා. 12.55 ට, 2017 ජූලි මස 04 වන දින පූ.භා. 09.30 වන තෙක් කල් ගියේය.***

හේමන්ත සමරකෝන්,
ලේකම්,
බස්නාහිර පළාතේ පළාත් සභාව.

2017.06.20
බස්නාහිර පළාතේ පළාත් සභාව,
5 වන මහල,
බී පර්යන්තය,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.